
# රූමතී පොල්කිච්චි



ජානකී සූරියආරච්චි



කතාව චිත්‍ර පරිගණක අක්ෂර සහ පරිගණක වර්ණ සංයෝජනය

**ජානකී සූරියආරච්චි**

**ස්තුතිය !**

මගේ පොත් වල අඩුපාඩු නොබැලුවද නිතරම මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ ආදර අම්මාටත්, මා ඉල්ලන, හැකි සියලු දේ මට ලබාදෙන මගේ ආදර තාත්තාටත්, “හරිම කරදරේ” කියමින් වුවද, මට නිරතුරුවම උදව් කරන (මගේ එකම පොතක් වත් කියවා නැති) මගේ ආදර මල්ලීටත්, මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදර ආච්චීටත්, මට සෙවනැල්ලක් මෙන් සිටින මගේ ආදර ලොකු අම්මාටත්, මගේ කතන්දර කියවා අඩුපාඩු පෙන්වාදෙන මගේ ආදර මිතුරු මිතුරියන්ටත්, භාෂාවේ මා නොදත් දේ මට හොඳින් කියාදුන් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාට හා මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියටත්, කලට වේලාවට මුද්‍රණ කටයුතු නිමකර දුන් පාලිත පෙරේරා මහතාටත්, වචනයකින් හෝ මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය !

**ජානකී සූරියආරච්චි**
1490/8, හෝකන්දර පාර,
පන්නිපිටිය.
Tel: 94-11-2847438

© ජානකී සූරියආරච්චි

ISBN: 955-8251-00-0
**Book Ref: T/04/098**

# රැවටිච්චී පොල්කිච්චී



කුරැලු කැලේ ගම්මැද්දේ
පැණි මොර ගහ උඩ අත්තේ
පොල්කිච්චයි පොල්කිච්චියි
සතුටින් හිටියා

පොල්කිච්චා කළුම කළුයි
පොල්කිච්චිත් ඒ වගෙමයි
බඩ විතරක් සුදු පාටින්
චුට්ටක් පෙනුනා



පොල්කිච්චී කළු වුණාට
හරි ආසයි හැඩට වැඩට
වෙන වැඩ නෑ මුළු දවසම
හැඩ වැඩ වෙනවා

පොල්කිච්චත් අනේ මගේ
පොල්කිච්චී නේද කියා
ආදරේට මුළු ගෙදරම
වැඩපළ කෙරුවා

"බත් මුට්ටිය රොස් වෙලාද
රෙදි ඔක්කොම සේදුවාද
එහෙනම් මගෙ කොණ්ඩෙ ටිකක්
පීරනවාද"



ඔහොම ටික දොහක් යනකොට
කුරුලු ගමේ මඟුල් ගෙයක් !
මේ පොල්කිච් ජෝඩුවටත්
බුලත් හම්බුණා

"මඟුල් ගෙදර යන්නට මට
අලුත් මෝස්තරයෙන් හැඩ
ඇඳුමක් නෑ ! මට නම් බෑ !"
කෙඳිරිලි ඇසුණා



අනේ අපේ පොල්කිච්චා
හම්බ වෙලා අච්ච්චියා
හොඳ ඇඳුමක් මහල ණායට
ගෙනැවිත් දුන්නා


ඇඳුම ඇඳල හරි අගේට
ඒ පැත්තට මේ පැත්තට
කැරකි කැරකි පොල්කිච්චී
දුකෙන් ලත වුණා

"ඇඳලා ඇඳුමක් ලස්සන
හැඩ වුණාට මං මෙච්චර
බලාගන්න මගෙ ලස්සන
විදියක් නැතුවා"



අනේ ඉතින් පොල්කිච්චා
කැලෑ ගමට පියාඹලා
ගම හාමිනෙ හම්බවෙලා
මේ දුක කීවා

ගම හාමිනෙ හැඩකාරී
මුළු ගමටම සීදේවී
හැඩ බලන්න කන්නාඩී
දීලා යැව්වා



"හාමිනෙ මගෙ පොල්කිච්චී
ගෙනාව මං කන්නාඩී
බලන්න හැඩ දැන් ලංචී"
කියා හිනැහුනා

පොල්කිච්චී හරි සතුටින්
ඇඳගෙන හොඳ ඇඳුම අලුත්
කන්නාඩිය ළඟට ගිහින්
එබිලා බැලුවා

"අනේ අපොයි මේ කවුරුද
කැත වෙලාද මං මෙච්චර
අනේ ඉතින් ඉඳල මොටද"
විලාප දුන්නා



"අනේ කොහොම ඉවසන්නද
හාමිනෙ මගෙ අඬන තරම"
පොල්කිච්චා කැලෑ ගමට
ආයෙත් දිව්වා

ගම හාමිනෙ ළඟට ගිහින්
කියලා දුක කඳුළු පෙරන්
පොල්කිච්ච්චා පිළිසරණක්
ඉල්ලා සිටියා


නැතුවත් අකුරක් දන්නී
ඈ හොඳ නුවණක්කාරී
ඇගෙ හැඩ පින්තූරය දී
රහසක් කීවා



පොල්කිච්චා හරි සතුටින්
පින්තූරය අරන් ගිහින්
කන්නාඩිය මැද අලවා
මේ ලෙස කීවා

"හාමිනෙ මගෙ සිරියාවි
එන්නකො මෙහෙ දැන් හැඩවී
කන්නඩියට ටිකක් එබී
දැන් බලන්නකෝ"

"හිතාගන්න බෑ පුදුමයි
ගම හාමිනෙ වාගේමයි"
පොල්කිච්චි සන්තෝසෙන්
හැඩ වැඩ බැලුවා



යන්නට චිත් මගුල් ගෙදර
පීරා හිස දමා පුයර
රණ මොණරී වගේ හැඩට
පියවර තැබුවා

මඟුල් ගෙදර ගිහින් බොහොම
ලීලාවෙන් ආඩම්බර
පොල්කිච්චි අහක බලන්
ඉඳගෙන හිටියා


පොල්කිච්චිගෙ ආඩච්බර
දැක හැමදෙන මගුල් ගෙදර
කණින් කොණින් හෙම් හෙම්හිට
කසු කුසු ගෑවා



"හැබෑවටම මේ මොකක්ද
මක් වෙලාද පොල්කිච්චිට
නූලක් බැඳ යන්තරයක්
දමන්න ඕනෑ"

"ඉරිසියාව ඔය තරමට
මං ලස්සන නිසා නේද"
තරහ ගිහින් පොල්කිච්චි
හොඳටම බැන්නා

"ඇයි මේ හැටි කේන්තියක්
ඉරිසියාව නෑ කාටත්
තේරෙන්නෑ මේ මොනවත්"
කවුරුත් ඇහුවා



"මම දැන් හරි හැඩකාරයි
ගම හාමිනෙ වාගේමයි
කන්නාඩිය බැලුවාමත්
ඒ බව පෙනුණා"

"කවුදෑ ඔය හැටි ලස්සන
කළුවන් කළු ඔය මූණද
ගිහින් බලමු කන්නාඩිය"
කවුරුත් කීවා

"හොඳයි එන්න ඔය හැමෝම
ලස්සන මගෙ බලාගන්න"
පොල්කිච්චි කන්නාඩිය
වෙතට පියඹුවා

මහ වැස්සක් ඔය අතරේ
ඇද හැලුනා ගම් මැද්දේ
තෙමි තෙමි හැම ඒ වැස්සේ
පස්සෙන් දිව්වා



පැණි මොර ගහ උඩ අත්තේ
කන්නාඩිය එල්ලෙන්නේ
පොල්කිච්චී දුවල ගිහින්
එබිලා බැලුවා

"අයියෝ මේ මක් වෙලාද
මගෙ ලස්සන සේදිලාද"
පොල්කිච්චී මහ හයියෙන්
කෑ මොර දුන්නා

"හිහ් හිහ් හී - හිහ් හිහ් හී
රැවටිච්චී පොල්කිච්චී
කන්නාඩියෙ ගම හාමිනෙ
නොවැ මේ ඉන්නේ"

මහ වැස්සට සේදී ගිය
කන්නාඩියෙ පින්තූරෙට
රැවටුණාට පොල්කිච්චිට
සැවොම හිනැහුණා



මේ ඔක්කොම බලා ඉඳන්
පැණි මොර ගහ හෙමින් හෙමින්
පොල්කිච්චිට ආදරයෙන්
මේ ලෙස කීවා

"පොල්කිච්චී මේ අහන්න
ලස්සන හැමදා නෑ ළඟ
මේ පින්තූරය වාගෙම
නැති වී යනවා"

"ඒ වුණාට හිත ඇතුළත
ඇත්නම් ඔබෙ හොඳ ගතිගුණ
හැමදාමත් ඒ ලස්සන
ළඟ පවතිනවා"



ඇත්ත තමයි ඒ ඔක්කොම
ලස්සන නැතිවෙන ඉක්මන !
පොල්කිච්චි ලැජ්ජාවෙන්
තනිවම හිතුවා

ලස්සන මුහුණකට වඩා
ලස්සන හිත හරි අගනා
පොල්කිච්චි හොඳින් එදා
තේරුම් ගත්තා

ඊට පස්සෙ හැමදාමත්
පොල්කිච්චයි පොල්කිච්චියි
කුරුලු කැලේ ආදරයෙන්
සතුටින් හිටියා